කිසිමාකාරයකින් පාඨකයාව නොමග යවන සුළු නොවීම, මාධ්‍ය ආචාර ධර්මයන්හි ප්‍රමුඛතම කොන්දේසියක් වේ. විශ්වසනීය මූලාශ්‍ර ඔස්සේ තොරතුරු ලබාගැනීමත්, බහුමූලාශ්‍ර පරිශීලනයත් සඳහා ජනමාධ්‍යවේදීන් ධෛර්යමත් කෙරෙන්නේ ඒ හෙයිනි. එසේම සිරස්තල යොදනා විට අන්තර්ගතයේ අදාළ කරුණු නිරවද්‍යව සිරස්තලයේ පිළිබිඹු කරනා ලෙසින් පැවසෙන්නේද ඒ හෙයිනි.

උක්ත සඳහන් මාධ්‍ය ආචාර ධර්මයන් ඒ අයුරින් පිළි නොපදිනු ලැබූ විට පාඨකයා නොමඟ යෑමත්, පාඨකයා වික්ෂිප්ත වන සුළු පරස්පර තොරතුරු සන්නිවේදනය වීමත් සහ පුවතේ විශ්වසනීයත්වය හීන වීමත් සිදුවනු ඇත.

ඊට උදාහරණයක් ලෙසින් ජූලි 17 දින ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත් දෙකේ පාසල් යළි විවෘත කිරීම සම්බන්ධ පුවත් වාර්තාවන් දෙකක් ගත හැක. "පාසල් සඳුදා යළි ඇරෙයි" යන සිරස්තලයෙන් ඉදිරිපත් වූ ලංකාදීප පුවතේ අන්තර්ගතයේ සඳහන් වන්නේ, "...ලබන සතියේ පාසල් විවෘත කිරීමට හැකි වාතාවරණයක් ඇතිවනු ඇතැයි අමාත්‍යවරයා [බන්දුල ගුණවර්ධන] සඳහන් කළේය." යනුවෙනි. එසේම "Shcools countrywide to remain closed till General Election" යන මැයෙන් ඉදිරිපත් වූ ඩේලිමිරර් පුවතේ අන්තර්ගතයේ 'අදාළ සාකච්ඡාවන්ගෙන් පසු, මහමැතිවරණය සම්පූර්ණ වීම සහ වෛරස්‍ය පැතිරීම පාලනය වනතුරු අඩු තරමින් අගෝස්තු 5 වනදින දක්වා හෝ පාසල් වසා තබන ලෙසින් සෞඛ්‍ය අමාත්‍යාංශය අධ්‍යාපන අමාත්‍යාංශයට නිර්දේශ කළ බව බලයලත් මූලාශ්‍රයන්ගෙන් පැවසුණු බව' සඳහන් වේ.

මෙහිදී මූලිකවම පුවත් වාර්තාවන් දෙකේම සිරස්තලයන් නොමග යවන සුළු බව නිරීක්ෂණය කළ හැක. පුවත් අන්තර්ගතයේ සඳහන් පරිදි පාසල් විවෘත කිරීම නිල වශයෙන් තහවුරු නොවූ පසුබිමක, සිරස්තලය හඟවන්නේ එය ස්ථිර වූ තීරණයක් ලෙසයි. එකිනෙකට වෙනස් මූලාශ්‍ර දෙකක් මගින් ඉදිරිපත් කොට ඇති තොරතුරු ඔස්සේ කියැවෙන්නේ පාසැල් විවෘත කිරීම සම්බන්ධයෙන් පවතින විවිධ කතිකාවන් හා මත දැක්වීම් වේ.

කෙසේ වෙතත් නිල වශයෙන් තහවුරු කෙරී නැති, මෙතෙක් නිල නිවේදනයක් ඉදිරිපත් වී නොමැති කරුණක්, තහවුරු වූ කරුණක් සේ සිරස්තලය තුළ දැක්වීම මගින්, පාඨකයා නොමග යන්නේ නොවේද? එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද?
#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #News #Lankadeepa #DailyMirror